- නිපුණතාව - නාට්‍ය හා රංගකලාව සම්බන්ධ විවිධ නිර්මාණ රසාස්වාදයට හා විචාරයට ලක්කරමින් ජීවිත අත්දැකීම් පෝෂණය කරයි
- පාඩම - නරඹන ලද නාට්‍යයක් විචාරය කරමු

## I කොටස

(01) නාට්‍ය විචාරය සම්බන්ධ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
1. නාට්‍යයේ සමස්තය නොව එක් එක් අංග විචාරයට ලක් කළ යුතුය.
2. විචාරයේදී නිර්මාණකරුවාගේ පළපුරුද්ද අවධානයට ගත යුතුය.
3. නාට්‍යකරුවාගේ මතවාදයට අප එකඟ නම් පමණක් විචාරය කළ යුතුය.
4. විචාරය නාට්‍ය කලාවේ ප්‍රගතියට බාධාවක් බව තේරුම්ගත යුතුය.
5. නිශ්චිත නිගමනයකට විචාරය නොකළ යුතුය.

(02) ශේක්ස්පියර්ගේ ජුලියස් සීසර් නාට්‍යයට ප්‍රස්තුත වූ මූලාශ්‍රය වන්නේ
1. හෝමර්ගේ ඉලියඩ් ය
2. වර්ජිල්ගේ මෙටමොෆෝසිස් ය
3. වර්ජිල්ගේ ඊනියඩ් ය
4. හෝමර්ගේ ඕඩිසි ය
5. ප්ලූටාර්ක්ගේ ග්‍රීක රෝම වංශවතුන්ගේ ජීවිත ය

(03) රූකඩ ගෙදර නාට්‍යයේ දෙවැනි අංකය ආරම්භයේ පසුතලය සකසා ඇති ආකාරයෙන් කුමක් අර්ථවත් වේ ද?
1. නත්තල සැමරීම නිමා වී ඇති බවයි.
2. නත්තල් තෑගි නිවැසියන් අතර බෙදා හදා ගෙන ඇති බවයි.
3. රූකඩ ගෙදර පුහු ආටෝපය ගිලිහෙමින් පවතින බවයි.
4. නත්තල් සමය අවසන් වන තෙක් නත්තල් ගස ඉවත් නොකළ යුතු බවයි.
5. නෝරා තුළ ඇති නොසන්සුන් බවයි.

(04) ඊඩිපස් නාට්‍යයේ ගායන වෘන්දය වේදිකාවට පැමිණෙන්නේ කුමන අවස්ථාවේද?
1. පූර්ව රංගය ආරම්භ වත්ම
2. පූර්ව රංගය නිමවීමට පෙර
3. පළමුවැනි අංකය ආරම්භයේ
4. පූර්ව රංගයේ ඊඩිපස් මහජනයා ඇමතීමෙන් පසු
5. පළමු වැනි අංකය අවසානයේ

(05) කුවේණි නාට්‍යය සම්බන්ධව නිවැරදි ප්‍රකාශය තෝරන්න.

1. නාට්‍ය ධර්මී ශෛලියට ලියැවී ඇත .
2. කුවේණිය පිළිබඳ සාම්ප්‍රදායික අදහස් පෝෂණය කරයි.
3. නාට්‍ය ධර්මී මෙන්ම ලෝක ධර්මී ලක්ෂණ ද අන්තර්ගතය.
4. කුවේණියට ප්‍රබල චරිත නිරූපණයක් ලැබී නැත .
5. රංගෝපකරණ කිසිවක් භාවිත නොවේ.

(06) ශාකුන්තලෝපාඛ්‍යානයේ දක්නට නොලැබෙන එහෙත් අභිඥාන ශාකුන්තලය දක්නට ලැබෙන අවස්ථාව තෝරන්න

1. ශාකුන්තලා මේනකා නම් දිව්‍ය අප්සරාව ගේ දියණිය බව
2. කන්ව ගේ අසපුව මාලතී නදිය අසබඩ පිහිටි බව
3. දුර්වාසස් ඍෂිවරයාගේ ශාපය
4. රජ දඩයමේ යෑම
5. ශාකුන්තලාට සක්විති රජෙකු වන පුත්‍රයකු ලැබෙන බව

## II කොටස

සියලු ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න

(01) ඊඩිපස් නාට්‍ය සංකීයේ සංකීර්ණ ශෝකෝත්පාදනයක් ලෙස සැලකෙන්නේ ඇයි දැයි පැහැදිලි කරන්න

(02) රූකඩ ගෙදර නාට්‍යයේ භාවිත සංකේත භාවිතය නාට්‍යයේ අන්තර්ගතයට දක්වන සම්බන්ධතාවය පැහැදිලි කරන්න

(03) ජුලියස් සීසර් නාට්‍යය ඓතිහාසික මෙන්ම දේශපාලන නාට්‍යයක් ලෙස සැලකෙන්නේ මන්ද

(04) වර්තමානයේ කාන්තාව මුහුණ දෙන ගැටලු හෙන්රි ජයසේනයන් කුවේණිය නාට්‍ය තුළින් කතා කර ඇත්තේ කෙසේදැයි පැහැදිලි කරන්න